(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

**අංක 241.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2018 පෙබරවාරි මස 22 වැනි බ්‍රහස්පතින්දා පූ.භා. 10.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

112/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) තඹුත්තේගම රෝහලේ සායන ගොඩනැගිල්ල සාදා නිම කර රෝහලට භාර දුන් දිනය කවරේද;

(ii) එම ගොඩනැගිල්ල සඳහා වියදම් කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත ගොඩනැගිල්ල ඉදි කළ කොන්ත්‍රාත්කරුගේ නම කවරේද;

(ii) අදාළ කොන්ත්‍රාත්කරුට සම්පූර්ණ මුදල ගෙවා තිබේද;

(iii) එසේ නම්, ගෙවූ මුදල කොපමණද;

(iv) එම කොන්ත්‍රාත්කරුගේ මුදල් රඳවා ගෙන තිබේද;

(v) එසේ නම්, රඳවාගෙන ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ගොඩනැගිල්ලෙහි බිත්ති පුපුරා ගොස් ඇති බවත්;

(ii) මේ නිසා රෝගීන්ගේ හා රෝහල් කාර්ය මණ්ඩලයේ ජීවිතවලට තර්ජනයක් ඇති බවත්;

(iii) මේ වනතෙක් එම ගොඩනැගිල්ල අලුත්වැඩියා කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) (i) මෙම ගොඩනැගිල්ල පිළිසකර කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම පිළිසකර කිරීම් කටයුතු සිදු කරනු ලබන කොන්ත්‍රාත්කරුගේ නම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

931/'16

ගරු චන්දිම ගමගේ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (7)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය විසින් පෞද්ගලික අංශයෙන් විදුලිය මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කළයුතු බව විදුලිබල පනතේ සඳහන්ව ඇති බව දන්නේද;

(ii) මේ වනතෙක් සිදු කර ඇති විදුලිය මිලදී ගැනීම් සඳහා ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය අනුගමනය කර තිබේද;

(iii) එසේ නම්, ඒ කවර අවස්ථාවලදීද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1043/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) 2016 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩල වාර්ෂික සැසිය සඳහා ජනාධිපතිතුමාගේ සංචාරයට සහභාගී වූ දූත පිරිස කොපමණද;

(ii) උක්ත සංචාරයට සහභාගී වූ පුද්ගලයන්ගේ නම් සහ ඔවුන් දූත පිරිසට ඇතුළත් වූ පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සංචාරය සඳහා රජය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම් විසින් දැරූ සම්පූර්ණ පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1117/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක දිවිනැගුම ප්‍රජා මූල බැංකු (සමෘද්ධි බැංකු) සංඛ්‍යාව කොපමණද;

(ii) එම බැංකු පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) එක් එක් බැංකු ශාඛාවෙන් ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ (i) හි සඳහන් එක් එක් බැංකුවක සේවයේ නියුතු සේවකයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දැනට එම බැංකුවල සේවක පුරප්පාඩු තිබේද;

(iii) එසේ නම්, එම පුරප්පාඩු සඳහා සේවකයන් බඳවා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1191/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 1983 වර්ෂය වනවිට පුත්තලම දිස්ත්‍රික්කය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 1984 සිට 2009 දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) 2009 වර්ෂයේ යුද්ධමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් කාල පරිච්ඡේදය සඳහා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල, එක් එක් වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1278/'16

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (6)

(අ) (i) 2015.10.01 දිනට අධ්‍යාපන සේවා නියුක්තයන්ගේ සමූපකාර සකසුරුවම් හා ණය දෙන සමිතිය සතුව පවතින සම්පූර්ණ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) 2016.06.11 වනවිට එම සමිතිය සතුව තිබූ ස්ථිර තැන්පතු ප්‍රමාණය කොපමණද;

(iii) මේ වනවිට ඉහත කී සමිතියෙන් ණය අයදුම්කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ණය අයදුම්කරුවන් අතරින්, ණය අනුමත වූ නමුත්, මෙතෙක් ණය මුදල් මුදා හැර නොමැති සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(v) එම ණය අයදුම්කරුවන්ට ගෙවිය යුතු ණය මුදල්වල එකතුව කොපමණද;

(vi) එකී ණය අයදුම්කරුවන් වෙත ණය මුදල් මුදා හැරීම ප්‍රමාද වීමට හේතුව කවරේද;

(vii) ඉහත කී සමිතිය තම සාමාජිකයන් වෙත නිසි ලෙස ණය මුදල් මුදා හැරීමට නොහැකි තත්ත්වයකට පත්වී ඇති බව දන්නේද;

(viii) එසේ නම්, එම සමිතියේ මූල්‍ය පාලනය විධිමත් කිරීම සඳහා ඉදිරියේ දී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1298/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, ජාතික සහ පළාත් පාසල්වල සේවය කරන අනධ්‍යයන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මාතර දිස්ත්‍රික්කයේ ජාතික සහ පළාත් පාසල්වල පවතින අනුමත අනධ්‍යයන සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු සංඛ්‍යාව, ජාතික සහ පළාත් පාසල් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට පියවර ගන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා අදාළ වන බඳවා ගැනීමේ පටිපාටිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1376/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 130 ට අනුව, වැඩි අස්වනු ලබා දෙන බීජ හඳුන්වාදෙන සමාගම්වලට අර්ධ බදු විරාමයන් ලබා දුන්නේද;

(ii) එවැනි බදු සානුබලයක් ලබා ගත් සමාගම්වල නම් ලැයිස්තුව ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත යෝජනාවට අනුව, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ ආනයන බදු ඉවත් කිරීමට යෝජනා කළ බැවින්,

(i) 2015 ජනවාරි 01 දින වනවිට, ආනයන බදුවලින් නිදහස් කර තිබූ, යන්ත්‍රෝපකරණ ලේඛනයක්;

(ii) 2016 ජනවාරි 01 දිනෙන් පසු, ආනයන බදුවලින් නිදහස් කර තිබූ, යන්ත්‍රෝපකරණ ලේඛනයක්;

ඉදිරිපත් කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1466/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ තුළ පදිංචි අඩු ආදායම්ලාභී පවුල් සඳහා මන්ත්‍රීවරයන්ගේ විමධ්‍යගත අරමුදල්වලින් නොමිලේ සෙවිලි තහඩු බෙදා දුන් බව පිළිගන්නේද;

(ii) විමධ්‍යගත අරමුදල් යොදාගනිමින් මන්ත්‍රීවරයන් විසින් සිදු කරනු ලැබූ සෙවිලි තහඩු බෙදාදීම තහනම් කර තිබේද;

(iii) එසේ නම්, එයට හේතු කවරේද;

(iv) එම තහනම ඉවත්කර, පෙර තිබූ පරිදි මන්ත්‍රීවරයන්ගේ මාර්ගයෙන් සෙවිලි තහඩු බෙදාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1584/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) හොරණ, පෝරුවදණ්ඩ, වගවත්ත, පර්ත් නව නිවාස සංකීර්ණයේ අංක 39 දරන ලිපිනයේ පදිංචි පී. සීතාදේවි මහත්මිය, හොරණ, පර්ත් වත්තේ ළමා උයන් පාලිකාව ලෙස සේවයට බැඳුනු දිනය කවරේද;

(ii) ඇය සේවයෙන් අස්වූ දිනය කවරේද;

(iii) වසර 26 ක සේවය අවසන් කිරීමේදී ඇයට ලැබිය යුතු වන්දි මුදල හා පාරිතෝෂික මුදල කොපමණද;

(iv) 2016.11.26 දින එම මුදල ලබාදීමට කම්කරු දෙපාර්තමේන්තුව විසින් නියම කර තිබේද;

(v) එසේ නම්, එම වන්දි හා පාරිතෝෂික මුදල් නොගෙවා සිටින්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1595/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ දැනට ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් පළාත් පාලන ආයතනය මඟින් සේවා සපයනු ලබන ජන සංඛ්‍යාව, භූමි ප්‍රමාණය සහ ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ජනතාවට වැඩි පහසුකම් සපයා දීම සඳහා පුත්තලම දිස්ත්‍රික්කය තුළ අළුතින් ස්ථාපිත කිරීමට යෝජිත පළාත් පාලන ආයතන කවරේද;

(v) එසේ යෝජනා වී ඇති පළාත් පාලන ආයතන කඩිනමින් පිහිටුවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1601/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය යල් පැන ගොස් ඇති බව දන්නේද;

(ii) ශ්‍රී ලංකාවේ කාලීන සහ අනාගත අපේක්ෂාවන් සඳහා ගැලපෙන ජාතික බලශක්ති ප්‍රතිපත්තියක් අවශ්‍ය බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එම නව ජාතික බලශක්ති ප්‍රතිපත්තිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1603/'17

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කොළඹ නගරයට විදුලිය සපයන ප්‍රධාන භූගත විදුලි සැපයුම් මාර්ගයක් වසර 03ක පමණ සිට අක්‍රියව පවතින බව දන්නේද;

(ii) එම මාර්ගයේ විදුලි සැපයුම් ධාරිතාවය කොපමණද;

(iii) එකී සැපයුම් මාර්ගය යථා තත්ත්වයට පත් කිරීම සඳහා පියවර ගැනීම ප්‍රමාද වීමට හේතුව කවරේද;

(iv) එකී සැපයුම් මාර්ගය අලුත්වැඩියා කිරීම ප්‍රමාද වීම පිළිබඳව වගකිවයුතු නිලධාරීන් කවුරුන්ද;

(v) එම එක් එක් නිලධාරියාට එරෙහිව අමාත්‍යාංශය හෝ ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙතෙක් ගෙන ඇති විනයානුකූල පියවර වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) කොළඹ නගරයේ අඛණ්ඩ විදුලි සැපයුමක් සහතික කිරීම සඳහා සම්ප්‍රේෂණ පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1622/’17

ගරු හේෂාන් විතානගේ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ සීනි අවශ්‍යතාවය සපුරාලීමේදී සෙවනගල සීනි කර්මාන්තශාලාව ඉතා වැදගත් වන බවත්;

(ii) එමගින් විශාල වක්‍ර හා සෘජු රැකියා අවස්ථා සංඛ්‍යාවක් බිහිවී ඇති බවත්;

(iii) දැනට මෙම කර්මාන්තශාලාව ආශ්‍රිතව ලබා දී ඇති ඉඩම්වල ගොවීන් උක් වගා නොකර වෙනත් වගාවන් සඳහා යොමු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) සෙවනගල සීනි කර්මාන්තශාලාව ආශ්‍රිතව උක් වගාව සඳහා ගොවීන් වෙත වෙන් කර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(ii) දැනට උක් වගාව සිදු කරන ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(iii) දිනෙන් දින උක් ගොවියා වෙනත් වගාවන් සඳහා යොමු වීමෙන් එම කර්මාන්තශාලාවෙන් අපේක්ෂිත නිෂ්පාදනය ලබා ගැනීමට නොහැකි විය හැකි බව පිළිගන්නේද;

(iv) එසේ නම්, මෙම කර්මාන්තශාලාවෙන් වැඩි නිෂ්පාදනයක් ලබා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ශෝක ප්‍රකාශ යෝජනා

1.

අභාවප්‍රාප්ත ගරු (මහාචාර්ය) ඩබ්ලිව්. ඒ. විශ්වා වර්ණපාල මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

2.

අභාවප්‍රාප්ත ගරු ඊ්ලියන් එම්. නානායක්කාර මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2018 මාර්තු මස 06 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2018 පෙබරවාරි 19),— “පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත සම්බන්ධයෙන් 2017 නොවැම්බර් මස 07 වැනි අඟහරුවාදා පිළිගන්වන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව සලකා බැලීම.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*2.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2018 පෙබරවාරි 19),— “පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ චර්යා ධර්ම සම්බන්ධයෙන් 2017 නොවැම්බර් මස 07 වැනි අඟහරුවාදා පිළිගන්වන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ අවසන් කෙටුම්පත අනුමත කළ යුතුය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*3.

සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝග,— 2006 අංක 11 දරන මුදල් පනතේ 8 වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 6 (2) වගන්තිය යටතේ ටෙලිනාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩසටහන් බද්ද සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 නොවැම්බර් 07 දිනැති අංක 2044/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සහ උප සභාපතිවරයාගේ පාරිශ්‍රමික හා කොමිෂන් සභා සාමාජිකයන්ගේ දීමනා ප්‍රතිශෝධනය කිරීම,— 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතින් ස්ථාපිත මෙම කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික හා දීමනා එකී පනතේ 4(8) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු හෙයින්ද;

2017.11.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පදනම් කර ගනිමින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සහ උප සභාපතිවරයාගේ පාරිශ්‍රමික සහ කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා පහත පරිදි ප්‍රතිශෝධනය කිරීමට අනුමතිය ලබා දී ඇති හෙයින් ද;

(i) කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ උප සභාපතිවරයාට පිළිවෙළින් රු. 75,000/-ක් සහ රු. 60,000/-ක් වශයෙන් මාසික පාරිශ්‍රමිකයන් ගෙවීමටත්;

(ii) කොමිෂන් සභාවේ සාමාජිකයන්ට එක් රැස්වීම් වාරයක් සඳහා රු. 6,000/-ක දීමනාවක් ගෙවීමටත්;

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 13/2008 (iv)හි විධිවිධාන පරිදි සභාපතිවරයා සඳහා ලීටර් 225ක මිලට සමාන මාසික ඉන්ධන දීමනාවක් සහ උප සභාපතිවරයා සඳහා ලීටර් 170ක මිලට සමාන මාසික ඉන්ධන දීමනාවක් ලබා දීමටත්;

ඊට අනුකූලව, 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 4(8) වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයාට, උප සභාපතිවරයාට සහ සාමාජිකයන් වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් පාරිශ්‍රමික හා දීමනා ගෙවනු ලැබීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතියට යටත්ව 2015.11.27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එච්. එම්. ගාමිණී විජේසිංහ මහතා විගණකාධිපතිවරයා වශයෙන් පත්කර ඇති හෙයින්ද;

විගණකාධිපතිවරයාගේ වැටුප ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින්ද;

ජනාධිපතිවරයා විසින් 2017.11.14 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව 2017.12.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විගණකාධිපති, එච්. එම්. ගාමිණී විජේසිංහ මහතාට පහත පරිදි වැටුප් හා දීමනා ගෙවීමට අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) 2015.11.27 වැනි දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 අනුව SL - 4 වැටුප් පරිමාණයේ 08 වැනි වැටුප් පියවරේ පිහිටුවා වැටුප් ගෙවීම හා තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවීමට;

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව 2016.01.01 වැනි දින සිට වැටුප පරිවර්තනය කිරීමේ දී SL – 4 වැටුප් ක්‍රමය යටතේ එම චක්‍රලේඛයේ උපදෙස් පරිදි වැටුප් පරිවර්තනය කර ගෙවීමට; සහ

(ඇ) එකී වැටුප් පරිමාණයට අදාළ වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව, විගණකාධිපති, එච්. එම්. ගාමිණී විජේසිංහ මහතා වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

*7.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 27 දිනැති අංක 2047/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2017 දෙසැම්බර් 11) [1].

*9.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2017 දෙසැම්බර් 11) [1].

*10.

ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

සුරැකුම්පත් විනිමය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

භාර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5) (අ) ව්‍යවස්ථාව ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් සාදන ලද, 2017 දෙසැම්බර් 04 දිනැති අංක 2048/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු, මාධ්‍ය උපමාන අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු, 142 වගන්තිය යටතේ 2016 අංක 2 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි (මිල ඉහළ සීමා) නියෝග සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 දෙසැම්බර් 14 දිනැති අංක 2049/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*17.

වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 44 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 321 වගන්තිය යටතේ 2017 වෙළඳ නැව් (කුඩා වාණිජ යාත්‍රා) නියෝග සම්බන්ධයෙන් වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 04 දිනැති 2017/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

23.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

24.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

25.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

26.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

27.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

28.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

29.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

30.

ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

31.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---